මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார நிலைபேறு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணைய / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: MF/ST/01/02
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.09.01

## ප්‍රවෘත්ති නිවේදනය

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹීම

ඇමරිකානු ඩොලර් බිලියන 2.9 ක පමණ විස්තීරණ ණය පහසුකමක් යටතේ සහාය ලබා දෙනු ලබන වසර හතරක වැඩසටහනක් (“වැඩසටහන”) සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණි බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලධාරීන් විසින් ("බලධාරීන්") අද නිවේදනය කරන ලදී.

මෙරට සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය මූල්‍ය තිරසාරත්වය ප්‍රතිස්ථාපනය කිරීම අරමුණු කර ගත් ප්‍රතිසංස්කරණ යෝජනාවලියකට එකඟ වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩල කණ්ඩායම මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ 2022 අගෝස්තු 24 දින සිට කොළඹදී රැස්වීම් ගණනාවක් පැවැත්වූ අතර, එම දූත මණ්ඩල සාකච්ඡා අවසානයේදී මෙම නිවේදනය නිකුත් කරන ලදී.

නිවේදනය නිකුත් කිරීමත් සමඟ, මුදල් අමාත්‍ය සහ ශ්‍රී ලංකාවේ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පහත ප්‍රකාශය නිකුත් කරනු ලැබිය. "මෙම එකඟතාවය අප රටෙහි ජනතාවට වඩා හොඳ ජීවිතයක් ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදුකිරීමට අපගේ කැපවීම පිළිබඳ සාක්ෂියකි. වර්තමානයේ පවතින විදේශ අංශයේ අසමතුලිතතාවයන් විසඳීමට සහ අපගේ ආර්ථික වර්ධන යාන්ත්‍රණය යළි පණගැන්වීම සඳහා අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ අනෙකුත් සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ මූල්‍ය සහාය ලබා ගැනීමට එය මඟ පාදයි. කෙටි කාලයක් තුළ එම එකඟතාවයට එළඹීම සඳහා දැක්වූ වෙහෙස සහ කැපවීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායමට, මුදල් අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට මා කෘතඥ වෙනවා."

එකඟ වූ ආර්ථික ප්‍රතිසංස්කරණ පැකේජය, ශ්‍රී ලංකාව දැනට මුහුණ දී සිටින අභියෝගවලට පුළුල් ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා සකස් කර ඇත. (i) වඩාත්ම අවදානමට ලක්විය හැකි අය ආරක්ෂා කරන සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගෙන යන අතරතුර, රාජ්‍ය මූල්‍ය ගැලපීම් සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ප්‍රතිස්ථාපනය කිරීම, (ii) මිල ස්ථායිතාව නැවත ඇති කිරීම සහ විදේශීය අංශයේ අතිරික්ත සංචිත ගොඩනැගීම සහ (iii) ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ ආයතනික පාලනය වර්ධනය තුළින් රටේ වර්ධන විභවතාවය මතු කර ගැනීම, මෙම වැඩසටහනේ අරමුණු වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළඹීම, රජය විසින් ඉතා කඩිනමින් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණක් වන අතර, එය පසුගිය මාසයේ දී ගරු ජනාධිපතිතුමා එම තනතුරට පත් වීමෙන් අනතුරුව ලබා දුන් මහ පෙන්වීමක් විය. වැඩසටහන

ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා බලධාරීන් විසින් කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවය යටතේ එකඟ වූ පූර්ව ක්‍රියාකාරකම් සිදු කිරීම සහ ශ්‍රී ලංකාවේ නිල ද්වීපාර්ශවික ණය හිමියන්ගෙන් අවශ්‍ය මූල්‍යනය තහවුරු කර ගැනීමේ කටයුතු සිදු කරනු ඇත.

බලධාරීන් ඔවුන්ගේ ජාත්‍යන්තර මූල්‍ය හා නීති උපදේශකයින් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපායමාර්ග සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටියි. මෑතකාලීනව රටේ ඇති වූ ප්‍රවණතා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය සමඟ එකඟ වූ ප්‍රතිසංස්කරණ පැකේජයේ ප්‍රධාන ක්ෂේත්‍ර සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර පිළිබඳව යාවත්කාලීන කිරීමට, ඉදිරි සති කිහිපය තුළ බලධාරීන් විසින් ණය හිමියන් වෙත කරුණු ඉදිරිපත් කිරීම් සිදු කිරීමට අපේක්ෂිතය.

ණය හිමියන්ගේ ඕනෑම විමසීමක් සඳහා lk.investors@lazard.com / srilanka@cliffordchance.com මඟින් කරුණාකර සම්බන්ධ වෙන්න.